2024.08.

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## භූගෝල විද්‍යාව

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය/නම:........................................

| 8 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02යි |
|---|---|---|

❖ I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

<u>I කොටස</u>

- අංක 01 සිට අංක 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ,
   - i) බ්‍රහස්පති ය.
   - ii) චන්ද්‍රයා ය.
   - iii) සූර්යයා ය.
   - iv) සෙනසුරු ය.

2. පෘථිවිය මත ජලයේ ව්‍යාප්තිය අනුව මිරිදිය ජලය පවතින ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද?
   - i) 0.5 %
   - ii) 1.97 %
   - iii) 0.3 %
   - iv) 0.03 %

3. ලොව අභ්‍යවකාශ ගවේෂණය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය පිහිටි රට කුමක්ද?
   - i) ප්‍රංශය
   - ii) ඇමෙරිකා එක්සත් ජනපදය
   - iii) ජපානය
   - iv) බ්‍රිතාන්‍යය

4. භ්‍රමණ කාලය පැය 23 යි විනාඩි 56 ක් වන්නේ,
   - i) පෘථිවියේ ය.
   - ii) සිකුරුගේ ය.
   - iii) සෙනසුරුගේ ය.
   - iv) අඟහරුගේ ය.

5. උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ යාම, ශාක පත්‍ර හැලී යාම ආරම්භ වීම ඉහත සඳහන් ලක්ෂණ දක්නට ලැබෙන සෘතුව මින් කුමක්ද?
   - i) සරත් සෘතුව
   - ii) ශීත සෘතුව
   - iii) ගිම්හාන සෘතුව
   - iv) වසන්ත සෘතුව

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති වාක්‍ය හරි නම් "✓" ලකුණ ද, වැරදි නම් "×" ලකුණ ද යොදන්න.

6. සූර්යයා සහ ග්‍රහක වළල්ල අතර පිහිටි ග්‍රහලෝක, අභ්‍යන්තර ග්‍රහලෝක වේ. ( )
7. සෞරග්‍රහ මණ්ඩලයේ අධිකතම උෂ්ණත්වයෙන් යුතු ග්‍රහලෝකය බුධ ය. ( )
8. පෘථිවි පරිභ්‍රමණයේ දී දේශාංශ $15^0$ ක් ගමන් කිරීම සඳහා විනාඩි 60 ක කාලයක් ගතවේ. ( )
9. සමකයට සමාන්තරව උතුරට $90^0$ ක් දක්වා විහිදෙන්නේ උතුරු අක්ෂාංශයි. ( )
10. අන්දමන්, මාලදිවයින්, සුමාත්‍රා වැනි දූපත් පැසිපික් සාගරයේ පිහිටා ඇත. ( )

- වරහන තුළ ඇති වචන උපයෝගී කරගෙන අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.

(71 %, ඕස්ට්‍රේලියාව, සූර්ය විෂුවය, නේපාලය, කක්ෂය, බෙංගාල බොක්ක, පෝක් සමුද්‍ර සන්ධිය)

11. පෘථිවිය සූර්යයා වටා ගමන් කරන මාර්ගය ................................ නම් වේ.
12. මාර්තු 21 දින සමකයට හිරු මුදුන් වීම ................................ ලෙස හැඳින්වේ.
13. මුළු පෘථිවි තලයෙන් ................................ ක් ජලයෙන් වැසී පවතී.
14. ................................ දකුණු ආසියාතික රටකි.
15. ශ්‍රී ලංකාව හා ඉන්දියාව වෙන්වන පටු මුහුදු තීරය ................................ නම් වේ.

- අංක 16 සිට 20 දක්වා ' අ ' තීරුව සමග ' ආ ' තීරුව නිවැරදිව ගලපා යා කරන්න.

| ' අ ' | ' ආ ' |
|---|---|
| 16. සූර්යයා | සිසිර නිවෘත්තිය |
| 17. ප්ලූටෝ | ජාත්‍යන්තර දින රේඛාව |
| 18. දෙසැම්බර් 22 | වර්ග කිලෝමීටර් මිලියන 510 |
| 19. දේශාංශ | සූර්ය කුණාටු |
| 20. පෘථිවිය | වාමන ග්‍රහලෝකයකි. |

(ල.02 × 20 = 40)

REGISTRAR
De Mazenod College
Kandana.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

1. (අ) i) පහත දැක්වෙන භූ ලක්ෂණ වගුවේ දක්වා ඇති පරිදි වෙන් කර ලියා දක්වන්න.
(වනාන්තර, මංමාවත්, ගංගා, වගාබිම්, වැව)

| ස්වභාවික ලක්ෂණ | මිනිසා විසින් නිර්මාණය කරන ලද |
|---|---|
| ........................................... | ........................................... |

(ල.02)

ii) 1: 50000 භූ ලක්ෂණ සිතියම් සකස් කරන ලද්දේ කුමන දෙපාර්තමේන්තුවක් විසින් ද? (ල.02)

iii) ශ්‍රී ලංකාවේ 1: 50000 සිතියම්වල සමෝච්ච රේඛා දෙකක් අතර අන්තරය කොපමණ ද? (ල.01)

iv) ශ්‍රී ලංකාවම ආවරණය වීම සඳහා 1:50000 සිතියම් පත්‍ර කීයක් අවශ්‍ය ද? (ල.01)

(ආ) ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන සම්මත වර්ණ හා සංකේත භාවිත කරමින් පහත සඳහන් දෑ ඔබේ පිළිතුරු පත්‍රයේ ඇඳ දක්වන්න.

A - පාසල
B - පළාත් මාර්ග
C - තැපැල් කාර්යාලය
D - වී වගාව
E - වැව
F - රෝහල

(ල.01 × 06 = 06)

2.
i) සෞරග්‍රහ මණ්ඩලයේ කුඩා ම ග්‍රහලෝකය නම් කරන්න. (ල.02)
ii) සෞරග්‍රහ මණ්ඩලයට අයත් අභ්‍යවකාශ වස්තූන් 03 ක් නම් කරන්න. (ල.03)
iii) (අ) වැඩිම උපග්‍රහයන් සංඛ්‍යාවක් සිටින ග්‍රහලෝකය කුමක්ද? (ල.02)
(ආ) අතීතයේ දී අභ්‍යවකාශ තොරතුරු හෙළිකර ගැනීමට දායක වූ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න. (ල.02)
iv) ග්‍රහ මණ්ඩලය හා බැඳී පවතින විශ්වාස 03 ක් ලියා දක්වන්න. (ල.03)

3.
i) අභ්‍යන්තර ග්‍රහලෝක අතරින් විශාලතම ග්‍රහලෝකය කුමක්ද? (ල.02)
ii) වාමන ග්‍රහලෝක 02 ක් නම් කරන්න. (ල.02)
iii) රතු ග්‍රහයා ලෙස හැඳින්වෙන ග්‍රහලෝකය කුමක්ද? (ල.01)
iv) (අ) සූර්යයාගේ විශේෂ ලක්ෂණ 03 ක් ලියා දක්වන්න. (ල.03)
(ආ) පහත දැක්වෙන ග්‍රහ වස්තූන් අතර ඇති වෙනස්කම් 02 බැගින් ලියන්න. (ල.01 × 4 = 4)

| තාරකා | ග්‍රහලෝක |
|---|---|
| • ........................................<br>• ........................................ | • ........................................<br>• ........................................ |

REGISTRAR
De Mazenod College
Kandana

4.

i) පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන ප්‍රධාන ප්‍රතිඵල දෙකක් ලියා දක්වන්න. (ල.02)

ii) ලෝකයේ සම්මත වේලාවන් කිහිපයක් සහිත රටවල් 02 ක් නම් කරන්න. (ල.02)

iii) ශ්‍රී ලංකාවේ දැන් වේලාව පෙ.ව. 8.00 වේ. ලංකාවේ සිට දේශාංශ $30^0$ ක් නැගෙනහිර දිශාවට ගිය විට හමුවෙන රටෙහි දැන් වේලාව කීයද? (ල.03)

iv) වසන්ත සෘතුවේ සහ ශීත සෘතුවේ දැකිය හැකි ලක්ෂණ 02 ක් පිළිවෙලින් ලියන්න. (ල.02)

v) පෘථිවිය මත ජීවය ඇතිවීමටත් එහි පැවැත්මටත් හේතු වී ඇති සුවිශේෂී ගුණාංග 03 ක් ලියා දක්වන්න. (ල.03)

5.

i) වායුගෝලයේ බහුලව අඩංගු වායු වර්ග 03 පිළිවෙලින් නම් කරන්න. (ල.03)

ii) වායුගෝලයේ ප්‍රයෝජන 03 ක් නම් කරන්න. (ල.03)

iii) වායුගෝලය දූෂණය වීමට හේතු වන මානුෂ ක්‍රියාකාරකම් 03 ක් ලියා දක්වන්න. (ල.03)

iv) වායුගෝලය දූෂණය වීම අවම කිරීමට අපට ගත හැකි ක්‍රියාමාර්ග 03 ක් ලියා දක්වන්න. (ල.03)

6.

i) පෘථිවියේ ජලය පවතින ප්‍රධාන ආකාර 03 ක් ලියා දක්වන්න. (ල.03)

ii) පෘථිවිය මත ඇති ජල ව්‍යාප්තිය අනුව මිනිසාට ප්‍රයෝජනයට ගත හැක්කේ කුමන ජලය ද? කොපමණ ප්‍රමාණයක් ද? (ල.02)

iii) ජලයෙහි ඇති වැදගත්කම කරුණු 03 කින් ලියා දක්වන්න. (ල.03)

iv) ජලය දූෂණය වන ආකාර 02 ක් සඳහන් කරන්න. (ල.02)

v) ජලය අරපිරිමැස්මෙන් භාවිත කළ යුත්තේ ඇයි? එක් කරුණක් ලියා දක්වන්න. (ල.02)

7.

i) සූර්යයාගේ සිට පෘථිවියට ඇති දුර කොපමණද? (ල.02)

ii) "පෘථිවිය ගෝලාකාර වස්තුවක් ලෙස සැලකුව ද එය පූර්ණ ගෝලයක් නොවේ." මේ බව ඔප්පු කිරීමට එක් සාක්ෂියක් ලියා දක්වන්න. (ල.02)

iii) අක්ෂාංශ හා දේශාංශ වැදගත් වන්නේ ඇයි? (ල.03)

iv) අධික අවුරුද්දක් ඇතිවන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ල.03)

v) ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි දූපත් රාජ්‍යයන් 02 ක් නම් කරන්න. (ල.02)

vi) දකුණු ආසියානු රටවල් පමණක් එකතු වී නිර්මාණය කරගත් සංවිධානයේ නම කුමක්ද? (ල.01)

REGISTRAR
De Mazenod College
Kandana.